# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 27 දරන
# දේශීය ආදායම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 අගෝස්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

මිල : රු. 1.30 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1982 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 02/82

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

ඒ ඡේදයේ අවසානයට පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන්:—

"(xxxv) 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව;

(xxxvi) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය;

(xxxvii) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය;

(xxxviii) (i) අන්තර් ජාතික මෙහෙයුම් කටයුතුවල නිරත වූ;

(ii) යම් සමාගමකට අයිති වූ හෝ සමාගම විසින් කුලියට ගනු ලැබූ ; සහ

(iii) 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 30 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ කරන ලද තීරණයක හේතුවෙන් ලංකාවේ නැවක් ලෙස සලකනු ලබන්නා වූ

නැවකින් 1982 අංක 17 දරන සමාගම් පනතේ VIII වන කොටස යටතේ ලියාපදිංචිකරන ලද යම් සමාගමකට (ශ්‍රී ලංකාවේ වරායකට හෝ වරායකින් ඒ නැවෙන් මගින්, තැපැල්, ඇති කරන සතුන් සහ බඩු ප්‍රවාහනය කිරීමෙන් ඒ සමාගමට උද්ගත වන ලාභ සහ ආදායම නොවන) උද්ගතවන ලාභ සහ ආදායම;

2—ඒ 63867 16,025 (82/06)

(xxxix) 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය ;

(xl) 1982 අංක 7 දරන ජාත්‍යන්තර දඹල ආයතනය පනතින් පිහිටුවන ලද ජාත්‍යන්තර දඹල ආයතනය ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඔඔ) (i) 1982 අංක 17 දරන සමාගම් පනතේ VIII වන කොටස යටතේ ලියාපදිංචි කරන ලද සමාගමකට අයත් හෝ ඒ සමාගම විසින් කුලියට ගනු ලැබූ ; සහ

(ii) 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 30 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ කරන ලද තීරණයක හේතුවෙන් ලංකාවේ නැවක් ලෙස සලකනු ලබන්නා වූ

නැවක සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් පුද්ගලයකු විසින් යම් තක්සේරු වර්ෂයක දී උපයා ගන්නා ලද පඩි නඩි ; " ; සහ

(2) ඒ උපවගන්තියේ (ඕ) ඡේදය අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

" තවද ඒ අනුව මේ ඡේදය යටතේ නිදහස් කරන ලද යම් ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක දී ඒ පුද්ගලයා විසින් අඩු කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් යම් ආදායම් බද්දක් ගෙවා ඇති විට, ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත ඒ පුද්ගලයා විසින් ලිඛිතව කරන ලද ඉල්ලීමක් මත ඒ බද්ද ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ඉ) ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමතය ඇතිව, යම් තැනැත්තකු විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් යම් වාණිජ බැංකුවක විවෘත කරන ලද යම් ගිණුමක විදේශීය ව්‍යවහාර මුදලින් ඔහුගේ බැරට ඇති මුදල් මත ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවේ වාසික නොවන කාලය තුළ සහ ඔහු ශ්‍රී ලංකාවේ වාසිකයකු වීමට ආරම්භ වන දිනයට ඉක්බිතිවම එළඹෙන අවුරුදු තුන සඳහා උපචිත වන පොලිය ; ".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ආ) ඡේදයේ " මේ පනතේ 15, 16, 16අ, 16ආ, 17, 18, 19, 20, 21, 22අ, 22ආ සහ 22ඇ වගන්ති යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ ආදායම් බද්දෙන් නිදහස් " යන වචන සහ ඉලක්කම් වෙනුවට " මේ පනතේ 8 (xxxviii) වන, 15 වන, 16 වන, 16අ, 16ආ, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 අ, 22ආ, 22ඇ වගන්ති යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ ආදායම් බද්දෙන් නිදහස් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (ඉ) ඡේදයෙහි " ධීවර අමාත්‍යාංශය විසින් " යන වචන වෙනුවට " ධීවර අමාත්‍යාංශය විසින් ; ", යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තිය අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

" (ඊ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතින් පිහිටුවන ලද අපනයන සංවර්ධන අරමුදලෙන් ".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (ඇඇ) යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කර ගෙන යන හෝ ක්‍රියාත්මක කරන යම් වාසික සමාගමක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ යම් වෘත්තියක් හෝ රක්ෂාවක් හෝ ඉදිකිරීමේ යෝජනා ක්‍රමයක් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන හෝ ක්‍රියාවේ යොදවන අතරතුර දී, යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවෙන් පිටත, ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන්, ඒ සමාගම විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් හෝ ඒ තක්සේරු වර්ෂය තුළ, විදේශීය ව්‍යවහාර මුදලින් උපයන යම් ලාභ සහ ආදායම් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබිණි නම්, (යුක්තිසහගත වියදම් වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන මුදල් ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසුව) ඒ ලාභ සහ ආදායම්. ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (අ) ඡේදයෙහි " ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අමාත්‍යවරයා විසින් ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අනුමත කරන ලද්දා වූ ද, " යන වචන වෙනුවට " ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අමාත්‍යවරයා විසින්, ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට 1983 මාර්තු මස 31 වන දිනට ප්‍රථම අනුමත කරන ලද්දා වූ ද, " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වගන්තියේ "ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ;" යන වචන වෙනුවට "ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් 1983 මාර්තු මස 31 වන දිනට පෙර අනුමත කරනු ලබන්නා වූ;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16ආ වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 16ආ වගන්තියෙහි "ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත, සංචාරක කර්මාන්තයේ සංවර්ධන යට අත්‍යවශ්‍යයයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්," යන වචන වෙනුවට "ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත, සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට අත්‍යවශ්‍යයයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් 1983 මාර්තු මස 31 වන දිනට පෙර අනුමත කරනු ලැබ ඇත්නම්," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූවා වූ ද ඒ දින යෙහි හෝ ඉන්පසුව" යන වචන වෙනුවට "1983 මාර්තු මස 31 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ, 1977 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ" යන වචන වෙනුවට "ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍ය වරයා විසින් අනුමත කරනු ලැබූ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන වෙනුවට "ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "1978 නොවැම්බර් මස 15 වන දිනට පසු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1978 නොවැම්බර් මස 15 වන දිනට පසු, එහෙත් 1983 මාර්තු මස 31 වන දිනට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිය මයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "වර්ග අඩි පන්සියයක්" යන වචන වෙනුවට "වර්ග අඩි එක්දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "වර්ග අඩි පන්සියයක් ඉක්මවන නමුත් වර්ග අඩි එක්දහස් දෙසිය පණහක් නොඉක්මවන්නේ නම්" යන වචන වෙනුවට "වර්ග අඩි එක්දහසක් ඉක්මවන නමුත් වර්ග අඩි එක්දහස් හත්සිය පනහක් නොඉක්මවන්නේ නම්," යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි "වර්ග අඩි එක්දහස් දෙසිය පනහක් ඉක්මවන නමුත් වර්ග අඩි දෙදහසක් නොඉක්මවන්නේ නම්," යන වචන වෙනුවට "වර්ග අඩි එක් දහස් හත්සිය පනහක් ඉක්මවන නමුත් වර්ග අඩි තුන්දහසක් නොඉක්මවන්නේ නම්," යන වචන ආදේශ කිරීමෙන්.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ "යම් තැනැත්තකු" යන වචන වෙනුවට "1981 නොවැම්බර් මස 12 වන දිනට පෙර යම් තැනැත්තකු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වගන්තියේ (ආ) ඡේදයේ "අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන වෙනුවට "1983 මාර්තු මස 31 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ආ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන වෙනුවට "1983 මාර්තු මස 31 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22ආ වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇ වගන්තියේ (ඇ) ඡේදයෙහි "අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ" යන වචන වෙනුවට "1983 මාර්තු මස 31 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද්දාවූ" යන වචන වෙනුවට "1983 මාර්තු මස 31 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද්දාවූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇ වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඉ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 22ඈ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඉ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"16 වන, 16අ, 16ආ, 20 වන, 22අ, 22 ආ, 22ඈ හෝ 22 ඈ වගන්ති යටතේ ප්‍රදානය කරන ලද අනුමත කිරීම් අවලංගු කිරීම නිර්දේශ කිරීමට කොමසාරිස් ජනරාල් වරයාගේ බලය.

22ඉ. අවස්ථාවෝචිත පරිදි යම් සමාගමක්, ව්‍යවසායක්, ඉදිකිරීමක්, ගිවිසුමක් හෝ යෝජනා ක්‍රමයක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ දින සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත—

(අ) 16 වන වගන්තිය හෝ 16අ වගන්තිය හෝ 16ආ වගන්තිය හෝ 20 වන වගන්තිය හෝ 22ඇ වගන්තිය හෝ 22ඈ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් සමාගමක් හෝ යම් ව්‍යවසායක් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට කිසියම් පියවරක් ගෙන නොමැති බවට ; හෝ

(ආ) සමාගමක් හෝ ව්‍යවසායක් සම්බන්ධයෙන් 16ආ වගන්තිය හෝ 22අ වගන්තිය හෝ 22ආ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ඉදිකිරීමක්, ගිවිසුමක් හෝ යෝජනා ක්‍රමයක් ඒ සමාගම හෝ ව්‍යවසාය විසින් ආරම්භ කර නොමැති බවට

කොමසාරිස් ජනරාල්වරයා හැඟීමට පත්වන අවස්ථාවක, ඒ අනුමතය අවලංගු කරන ලෙස ඔහු විසින් අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබිය යුතු ය. තවද, ඒ නිර්දේශය මත ආර්ථිකයේ යහපත කෙරෙහි සැලකිල්ල ඇතිව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ අනුමතය අවලංගු කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉඉ) 1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබ, ඔහු විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නාවූ යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ඔහු විසින් පාවිච්චි කරනු ලබන්නා වූ, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කළ සහාධිපත්‍ය දේපළක් සංයුක්ත වන නිර්වාසික ඉඩකඩ පිළිබඳ යම් ඒකකයක් ගෙවී යාමෙන් ක්ෂයවීම සඳහා යුක්ති සහගත

යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන්නා වූ (අත්කර ගැනීමේ පිරිවැය මත වර්ෂය කට නියමිත යම් සියයට අනුප්‍රමාණයක් අනුව ගණන් බලනු ලැබූ) දීමනාවක්:

එසේ වුව ද ඉහතින් වූ තක්සේරු වර්ෂවල ක්ෂයවීම් සඳහා දීමනාවල එකතුව ඒ ඒකකය අත් කර ගැනීමේ පිරිවැයට සමාන වන්නේ නම්, මේ ඡේදයේ විධිවිධාන යටතේ කිසිම අඩුකිරීමක් ඒ ඒකකය සම්බන්ධයෙන් යම් තැනැත්තකුට ඉඩ දෙනු නොලැබිය යුතු ය;";

(ආ) ඒ උපවගන්තියේ (ඹ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්—

"(ඹ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරගෙන යනු ලබන යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධ යෙන් ලාභ සහ ආදායම නිශ්චය කර ඇත්තේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව සම් බන්ධයෙන් ඒ තැනැත්තා ගෙවීමට යටත් වන්නා වූ—

(i) 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු වන යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක්, හෝ

(ii) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 47 වන වගන්තිය යටතේ ඉඩ දෙනු ලැබිය හැකි යම් අඩු කිරීම් අඩු කොට ඒ පනත යටතේ ගෙවිය යුතු පිරිවැටුම් බද්දක්;";

(ඇ) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි "(1) (අ), (1) (ආ), (1) (ඇ), (1) (ඈ), (1) (ඉ) හෝ (1) (ඊ) උපවගන්තිය යටතේ" යන ඉලක්කම් සහ වචන වෙනුවට "(1) (අ), (1) (ආ), (1) (ඇ), (1) (ඈ), (1) (ඉ), (1) (ඉඉ) හෝ (1) (ඊ) උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඈ) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ (ඈ) ඡේදය හෝ (ඉ) ඡේදය, හෝ (ඉඉ) ඡේදය යටතේ හෝ 162 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "පළාත් පාලන ආයතනයකට, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට" යන වචන වෙනුවට "පළාත් පාලන ආයතනයකට, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබුවේ යයි සලකනු ලබන්නා වූ යම් උසස් අධ්‍යාපන ආයතනයකට, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයේ (v) අනුඡේදයේ අවසානයට පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :—

"(vi) 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය ;

(vii) 1982 අංක 7 දරන ජාත්‍යන්තර දඹල ආයතන පනතින් පිහිටුවන ලද ජාත්‍යන්තර දඹල ආයතනය ;" ;

(ඇ) එම උපවගන්තියේ (ඕ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඕ) (i) යම් නිවාසයක්, මහල් නිවාසයක්, හෝ ඒකකයක් යම් තැනැත්තකු විසින් සේවයෙහි නියුක්ත කරන ලද කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු වාසය කරන නිවාසයක් වශයෙන් පදිංචිය සඳහා නම් ;

(ii) ඒ නිවාසයේ, මහල් නිවාසයේ හෝ ඒකකයේ බිම් ප්‍රදේශය වර්ග අඩි දෙදහසක් නොඉක්මවන්නේ නම් ; සහ

(iii) ඒ නිවාසය, මහල් නිවාසය හෝ ඒකකය වෙනුවෙන් 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ හෝ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ කිසිම දීමනාවක් අඩු කරනු ලැබිය නොහැකි නම්

යම් නිවාසයක් හෝ මහල් නිවාසයක් ඉදිකිරීමෙහි ලා හෝ (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද) නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතය ඇතිව ඉදිකරන ලද්දාවූ ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ද නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය දේපළක් සංයුක්ත වන්නාවූ ද, වාසික ඉඩකඩ

පිළිබඳ යම් ඒකකයක් මිලට ගැනීම් වශයෙන් හෝ ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදල් ප්‍රමාණයක් ; "; සහ

(ඇ) ඒ උපවගන්තිය අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"(i) යම් බද්දක් අවුරුදු පනහක් ඉක්මවන කාලයක් සඳහා වන්නේ නම් ; සහ

(ii) යම් බද්දක් සඳහා වූ ගිවිසුමට එළඹි අවස්ථාවේ දී ඒ බද්ද සඳහා වූ ප්‍රතිෂ්ඨාව සම්පූර්ණයෙන් ගෙවනු ලැබුවේ නම්

මේ උපවගන්තියේ (ඉ) සහ (උ) ඡේදවල සහ (3) වන උපවගන්තියේ "මිලට ගැනීම" යන යෙදුම (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද) නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතය ඇතිව ඉදි කරනු ලැබුවා වූ ද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය දේපළක් සංයුක්ත වන්නාවූ ද, වාසික ඉඩකඩ පිළිබඳ ඒකකයක බද්දක් ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32අ, 32ආ සහ 32ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙළින් 32අ, 32ආ සහ 32ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ආණ්ඩුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් වෙත සතු කරන ලද දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු වන වන්දිය මත වූ පොලිය සම්බන්ධයෙන් බදු අය කිරීමට අදාළ විශේෂ විධිවිධාන.

32අ. (1) ආණ්ඩුව හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ වෙත සතු කරනු ලැබූ යම් නිශ්චල හෝ චංචල දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය මත ගෙවිය යුතු වූ ඒ වන්දිය උපචිත වන දිනයෙන් ආරම්භව ඒ වන්දිය ගෙවීමේ දිනයෙන් අවසන් වන කාලය සඳහා ඒ වන්දිය මත ගෙවිය යුතු සමුච්චිත පොලිය වන ("අදාළ පොලිය" යනුවෙන් මේ වගන්තියේ සඳහන් වන) පොලිය සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද—

(අ) යම් තැනැත්තකු විසින් ලබාගන්නා ලද අදාළ පොලිය, ඒ පොලිය අදාළ වන්නේ යම් තක්සේරු වර්ෂයකට ද ඒ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තාට උද්ගතවන ආදායම ලෙස නොව ඒ පොලිය ඒ තැනැත්තා ලබා ගන්නේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂ

යේ දී ඔහුට උද්ගතවන ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද සියයට දහයක අනු ප්‍රමාණය අනුව ඒ පොලිය ආදායම් බද්දට යටත් විය යුතු ය ;

(ආ) යම් තැනැත්තකුට අදාළ පොලිය ගෙවනු ලබන ආණ්ඩුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය සංස්ථාව හෝ පළාත් පාලන ආයතනය විසින්, ඒ පොලියෙන් සියයට දහයකට සමාන මුදලක්, ඒ පොලියෙන් අඩු කරනු ලැබිය යුතුය. තවද ගෙවිය යුතු වන අදාළ පොලියේ දළ මුදල් ප්‍රමාණයේ විස්තර, අඩුකර ගන්නා ලද බද්ද, ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය, එය ගෙවනු ලැබුවේ යම් තැනැත්තකුටද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය දැක්වෙන ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් සමග එසේ අඩු කරගන්නා ලද මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය. තව ද එසේ ප්‍රේෂණය කරන ලද මුදල් ප්‍රමාණය (අ) ඡේදය යටතේ ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු වන බද්දෙන් හිලව් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියෙහි—

" ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව " යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අදහස් වේ ;

" රාජ්‍ය සංස්ථාව " යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

ඇතැම් තැන්පතු ගිණුම් මත ගෙවිය යුතු පොලියෙන් ආදායම් බදු අඩු කර ගැනීම.

32ආ. (1) (අ) යම් පුද්ගලයකු විසින්; හෝ

(ආ) යම් පුද්ගලයකු වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින්; හෝ

බැංකු ආයතනයක—

(i) ඒ බැංකු ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන; සහ

(ii) කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නිශ්චිතව සඳහන් කරනු ලබන කොන්දේසිවලට අනුකූලව

කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයක් යටතේ තැන්පත් කරන ලද මුදල් ප්‍රමාණයක් මත ගෙවන ලද (මේ වගන්තියේ "අදාළ පොලිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමුච්චිත පොලියට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

මේ උපවගන්තියෙන් කොමසාරිස් ජනරාල් වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යයි නියම කරන ලද යම් කාරණයක් නිශ්චිතව සඳහන් කිරීමේ දී ඉතිරි කිරීම් දිරි ගැන්වීමේ සහ පහසු කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි ඔහු විසින් සැලකිල්ල දක්විය යුතු ය.

(2) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් ව ඇත ද—

(අ) ඒ පොලිය අදාළ වන්නේ යම් තක්සේරු වර්ෂයකට ද ඒ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තාට උද්ගතවන ආදායම ලෙස නොව ඒ පොලිය ඔහුට ගෙවනු ලබන්නේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ දී ඔහුට උද්ගත වන ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද ඒ පොලිය සියයට පහළොවක අනුප්‍රමාණය අනුව හෝ ඒ තක්සේරු වර්ෂය සඳහා (අදාළ පොලිය හැර) ඔහුගේ ලාභ සහ ආදායම මත ඔහු ආදායම් බදු ගෙවීමට යටත් උපරිම අනුප්‍රමාණය යන දෙකින් කවර වූ වඩා අඩු අනුප්‍රමාණය අනුව ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ ය;

(ආ) ඒ පුද්ගලයාට අදාළ පොලිය ගෙවන බැංකු ආයතනය විසින්, (අ) ඡේදයේ කුමක් සඳහන් ව ඇත ද, ඒ පොලියෙන් සියයට

පහළොවකට සමාන මුදල් ප්‍රමාණයක් ඒ පොලියෙන් අඩු කරනු ලැබිය යුතු ය. තව ද, එසේ අඩු කර ගන්නා ලද මුදල නොපමාව කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය ;

(ඇ) බැංකු ආයතනයක් විසින් යම් පුද්ගලයකුට ගෙවනු ලබන අදාළ පොලියෙන් (ආ) ඡේදයට අනුකූල ආදායම් බද්දක් අඩු කරනු ලබන අවස්ථාවක, ගෙවිය යුතු වන අදාළ පොලියේ දළ මුදල් ප්‍රමාණය, අඩු කර ගන්නා ලද බදු අනුප්‍රමාණය සහ මුදල් ප්‍රමාණය සහ සැබවින් ම ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය දැක්වෙන ලිය විල්ලකින් වූ ප්‍රකාශයක් ඒ පුද්ගලයාට නිකුත් කරනු ලැබිය යුතු ය ;

(ඈ) (i) යම් පුද්ගලයකුට ගෙවනු ලබන අදාළ පොලියෙන් (ආ) ඡේදයට අනුකූල යම් මුදල් ප්‍රමාණයක් අඩු කරනු ලබන්නා වූ; සහ

(ii) (අදාළ පොලිය හැර) ඔහුගේ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ඒ අඩු කිරීම කරනු ලබන තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයා ආදායම් බදු ගෙවීමට යටත් උපරිම අනුප්‍රමාණය සියයට පහළොවකට වඩා අඩු වන්නා වූ

අවස්ථාවක, (ඇ) ඡේදයෙහි සඳහන් ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබූ විට සහ XXIII වන පරිච්ඡේදයේ විධිවිධානවලට යටත් ව, සියයට පහළොව සහ ඒ උපරිම බදු අනුප්‍රමාණය අතර වෙනසට සමාන අදාළ පොලියෙන් යම් ප්‍රතිශතයක් ආපසු ලබා ගැනීමට ඒ පුද්ගලයාට හිමිකම ඇත්තේ ය.

(3) බැංකු ආයතනයක් විසින් යම් පුද්ගලයකුට ගෙවන ලද අදාළ පොලියෙන් යම් ආදායම් බද්දක් අඩු කර ගැනීමට (2) වන උපවගන්තියෙන් නියමිත බැංකු ආයතනයක් ඒ ආදායම් බද්ද අඩු කර ගැනීම පැහැර හරින අවස්ථාවක, එවිට, මේ වගන්තිය යටතේ ඒ ආයතනය විසින් අඩු කර ගැනීමට නියමිත බද්ද සඳහා ඒ බැංකු ආයතනයේ අධ්‍යක්ෂවරයා, සාමාන්‍යාධිකාරිවරයා හෝ වෙනත් ප්‍රධාන නිලධරයා පෞද්ගලිකව වගකිව යුතු ය. තව ද ඒ බද්ද මේ පනතෙහි විධිවිධාන සලස්වන ලද සියලු ක්‍රමවලින් ඒ අධ්‍යක්ෂවරයාගෙන් සාමාන්‍යාධිකාරිවරයාගෙන් හෝ ප්‍රධාන නිලධරයාගෙන් අය කර ගනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයක් යටතේ පුද්ගලයකු විසින් බැංකු ආයතන යක මුදල් කිසිවක් තැන්පත් කරනු ලැබ ඇත්තා වූ ද, ඒ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් කොමසා රිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද කොන් දේසි කඩ කරමින් ඒ මුදල් මත වූ පොලිය ඒ පුද් ගලයා විසින් ඉවත් කර ගනු ලබන්නා වූ ද අවස් ථාවක, මේ පනතෙහි කුමක් සඳහන් ව ඇත ද, එසේ ඉවත් කර ගන්නා ලද පොලිය අදාළ වන් නේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ සෑම තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ම අතිරේක තක්සේරු කිරීම් කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම්, හවුල් ව්‍යාපාර සහ පුද්ගල මණ්ඩල විසින් දෙන ලද ණය පිළිබඳ දළ පොලිය මත ආදායම් බදු අනුප්‍රමාණය.

32ඇ. ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩල යක් විසින් ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුට දෙන ලද ණයක් මත ගෙවිය යුතු වන (මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ නිදහස් කරනු ලබන පොලිය නොවන්නා වූ) ඒ සමාගමට, හවුල් ව්‍යාපාරයට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයට උද්ගත වන්නාවූ හෝ උද්ගත වන්නේ යයි 80අ වගන්තියෙන් සලකනු ලබන්නාවූ පොලිය වන දළ පොලිය මත මේ පනතේ කුමක් සඳහන්ව ඇත ද, සියයට පහළොවක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන සහ (1අ) උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරී මෙන් :—

" (1) යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් ඒ වර්ෂය වෙනුවෙන් ගෙවීමට යටත් ආදායම් බද්ද—

(අ) ඒ වර්ගයේ සමාගම්වලට අදාළ වන්නා වූ අනු ප්‍රමාණය වශයෙන් මේ පනතේ දෙවන උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් උචිත අනුප්‍රමාණය අනුව ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ මුදල් ප්‍රමාණයකින්; සහ

(ආ) යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම ආගණනය කරනු ලැබුවේ යම් ලාභ මත ද ඒ ලාභවලින් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් බෙදා දෙන ලද දළ ලාභාංශවල මුළු ප්‍රමාණ යෙන්—

(i) ඒ තක්සේරු වර්ෂය 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය නම්, සියයට තිස්තුනයි තුනෙන් එකකට ; සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම්, සියයට විස්සකට

සමාන මුදල් ප්‍රමාණයකින් සමන්විත විය යුතුය :

එසේ වුවද නිල ලැයිස්තුගත පොදු සමාගමක් 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (ආ) ඡේදය යටතේ බදු ගෙවීමට යටත් නොවිය යුතු ය. ";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ " (1) වන සහ (1අ) උපවගන්තිවල කාර්ය සඳහා " යන වචන සහ ඉලක්කම් වෙනුවට " (1) වන උපවගන්තියේ කාර්ය සඳහා " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ " නිකුත් කරනු ලැබූ ප්‍රාග්ධනය රුපියල් ලක්ෂ පහකට වැඩි නොවූ ;" යන වචන වෙනුවට " බදු අය කළ හැකි ආදායම ආගණනය කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක් සඳහා ද ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේම නැතහොත් සමාගම සංස්ථාගත කිරීමේ දින සිට ඒ තක්සේරු වර්ෂය අවසානය දක්වා නිකුත් කරනු ලැබූ ප්‍රාග්ධනය රුපියල් ලක්ෂ පහකට වැඩි නොවූ " යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඇ) නිල ලැයිස්තුගත සමාගමක් නොවන සමාගමක " දළ ලාභාංශ ප්‍රමාණය " යන්නෙන්—

(i) ස්වකීය ලාභාංශ සම්බන්ධයෙන් සමාගම විසින් 38 වන වගන්තිය යටතේ අඩු කිරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක දී ඒ අඩු කිරීමට පෙර වූ ලාභාංශ ප්‍රමාණය ;

(ii) ස්වකීය ලාභාංශ සම්බන්ධයෙන් සමාගම විසින් එවැනි අඩු කිරීමක් කරනු ලැබ නොමැති අවස්ථාවක දී ලාභාංශ ප්‍රමාණය—

(අ) 1980 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ලාභාංශය ගෙවිය යුතු නම් ඉන් සියයට පනහකින් ; හෝ

(ආ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ලාභාංශ ගෙවිය යුතු නම් ඉන් සියයට විසිපහකින්

වැඩි කරනු ලැබූ විට ලැබෙන ලාභාංශ ප්‍රමාණය අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "දෙවන උපලේඛනයේ V වන කොටසෙහි සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දෙවන උපලේඛනයේ VII වන කොටසෙහි සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"නිර්වාසික සමාගමකට ගෙවිය යුතු ලාභාංශවලින් බද්දක් වාසික සමාගම විසින් අඩු කළ යුතු බව.

37. යම් තක්සේරු වර්ෂයක් තුළ යම් නිර්වාසික සමාගමකට ගෙවිය යුතු (මේ වගන්තියේ "අදාළ ලාභාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ලාභාංශ ප්‍රමාණයකින් සෑම වාසික සමාගමක් ම විසින්—

(අ) අදාළ ලාභාංශය මේ පනත යටතේ වූ ආදායම් බද්දෙන් නිදහස් ලාභාංශයක ප්‍රමාණයෙන් කොටසක් නොවන්නා වූ ද වෙනත් වාසික සමාගමකින් ඒ වාසික සමාගමකට ලැබෙන ලාභාංශයක මුදල් ප්‍රමාණයේ යම් කොටසකින් සමන්විත වන්නේ නම්, 1980 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ලාභාංශය ගෙවිය යුතු අවස්ථාවක, සියයට පනහකින් වැඩි කොට ද ඒ ලාභාංශය 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ගෙවිය යුතු අවස්ථාවක සියයට විසිපහකින් වැඩි කොට ද ඒ අදාළ ලාභාංශයේ මුදල් ප්‍රමාණයෙන් සියයට පහකට සමාන ආදායම් බද්දක් ;

(ආ) අදාළ ලාභාංශය මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් නොකළ ලාභාංශයක් වන්නේ නම් සහ ඒ වාසික සමාගමට වෙනත් වාසික සමාගමකින් ලැබෙන ලාභාංශයක යම් කොටසකින් සමන්විත නොවන්නේ නම්, ඒ අදාළ ලාභාංශයෙන් සියයට පහකට සමාන ආදායම් බද්දක් ;

(ඇ) අදාළ ලාභාංශය, මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් ලාභාංශයක් වන ඒ වාසික සමාගමට ලැබෙන ලාභාංශයක

මුදලින් ගෙවනු ලබන ලාභාංශයක් නම්, ඒ ලාභාංශයේ මුදල් ප්‍රමාණයෙන් සිය යට පහකට සමාන ආදායම් බද්දක්; සහ

(ආ) අදාළ ලාභාංශය නිල ලැයිස්තුගත සමාගමකින් වාසික සමාගමකට ලැබෙන ලාභාංශයක මුදල් ප්‍රමාණයෙන් ගෙවනු ලබන්නේ නම්, ඒ අදාළ ලාභාංශයේ මුදල් ප්‍රමාණයෙන් සියයට පහකට සමාන ආදායම් බද්දක්

අඩු කර ගනු ලැබිය යුතු ය:

එසේ වුවද ඒ නිර්වාසික සමාගම විසින් ඒ අදාළ ලාභාංශය ලබාගත් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට ඒ නිර්වාසික සමාගම යටත් නොවන බවට හෝ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ අදාළ ලාභාංශයෙන් අඩු කර ගනු ලැබීමට නියමිත මුදල් ප්‍රමාණයට වඩා අඩු මුදල් ප්‍රමාණයක් ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් වන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ නිර්වාසික සමාගම විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවීමට යටත් ආදායම් බදු ප්‍රමාණය කෙරෙහි සැලකිල්ල ඇතිව, ඒ අදාළ ලාභාංශයේ ප්‍රමාණයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ අදාළ ලාභාංශයෙන් ඒ වාසික සමාගමට නියමිත අනුප්‍රමාණයට වඩා අඩු අනුප්‍රමාණයක් අනුව ආදායම් බදු අඩු කර ගැනීමට ඔහු විසින් ඒ වාසික සමාගමට විධාන කරනු ලැබිය හැකි ය. තවද, මේ වගන්තිය යටතේ වාසික සමාගමක් විසින් අඩු කර ගනු ලැබීමට නියමිත ආදායම් බදු ප්‍රමාණය, ඒ වාසික සමාගමෙන් ජනරජයට ලැබිය යුතු, ණයක් විය යුතු අතර, එලෙස නොපමාව අය කර ගනු ලැබිය යුතු ය. නැතහොත් ඒ වාසික සමාගම විසින් අන්‍යාකාරයෙන් ගෙවිය යුතු යම් ආදායම් බද්දකට අතිරේකව ඒ සමාගම මත තක්සේරු කොට අයකර ගනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඊඊ) 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය;

(ඊඊඊ) 1982 අංක 7 දරන ජාත්‍යන්තර දඹල ආයතනය පනතින් පිහිටුවන ලද ජාත්‍යන්තර දඹල ආයතනය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (2) වන උප වගන්තියේ අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" මේ උපවගන්තියේ කාර්යය සඳහා (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද) නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතය ඇතිව ඉදිකරනු ලැබූ සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කළ සහ බිජතා දේපලක් සංයුක්ත වන්නා වූ ඉඩකඩ පිළිබඳ ඒකකයකින් නිර්වාසික සමාගමකට උද්ගතවන ලාභ සහ ආදායම, නිශ්චල දේපළවලින් ඒ සමාගමට ව්‍යුත්පන්න වන ලාභ සහ ආදායම නොවන ලෙස සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇ) 1958 ජූලි මස 18 වන දින හෝ ඊට පසු, යම් පුද්ගලයකුගේ ජීවිත කාලය සඳහා වටිනාකමින් රුපියල් ලක්ෂ පහක උපරිමයකට යටත්ව, මේ පනතේ 31 (9) වන වගන්තියේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියේ අර්ථානුකූලව අනුමත පූණ්‍ය කාර්යයක් වන පූණ්‍ය කාර්යයකට හෝ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් ආයතනයකට, පදනමකට හෝ කොමිෂන් සභාවකට ඒ එක් එක් ත්‍යාගයේ වටිනාකම රුපියල් එක් දහසකට අධිකව දෙනු ලැබූ ත්‍යාගයකට ;

(ඉ) ආණ්ඩුවට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබුවේ යයි සලකනු ලබන යම් උසස් අධ්‍යාපන ආයතනයකට දෙනු ලැබූ ත්‍යාගයකට ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 81අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 81අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

විදේශීය විනෝදාස්වාදය සපයන්නන්ට සහ ශිල්පීන්ට කරන ලද ගෙවීම්වලින් ආදායම් බදු අඩු කර ගැනීම.

81අ (1) සෑම තැනැත්තකු විසින්ම—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ; සහ

(ආ) විනෝදාස්වාදය සපයන්නකුගේ හෝ ශිල්පියකුගේ වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන

වෙනත් යම් තැනැත්තකුට, ඒ වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන අතරතුර ඒ වෙනත් තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දී කරන ලද සේවාවන් සම්බන්ධයෙන් ගෙවී

මක් කරන විට, ඒ ගෙවීමේ මුදල් ප්‍රමාණයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් ඒ ගෙවීමෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(2) තමා විසින් වෙනත් යම් තැනැත්තකුට කරන ලද ගෙවීමකින් (1) වන උපවගන්තියට අනුකූල ආදායම් බද්දක් අඩුකරගනු ලබන සෑම තැනැත්තකු ම, පහත දැක්වෙන විස්තර දක්වන ප්‍රකාශයක් ඒ වෙනත් තැනැත්තාට නිකුත් කළ යුතු ය:—

(අ) ලැබිය යුතු වන ගෙවීමේ දළ මුදල් ප්‍රමාණය;

(ආ) අඩු කර ගන්නා ලද බද්දේ අනුප්‍රමාණය සහ මුදල් ප්‍රමාණය;

(ඇ) සැබවින් ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට මේ වගන්තියෙහි සඳහන් ගෙවීමක් ඇතුළත් වන අවස්ථාවක, එවිට—

(අ) ඒ තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ නම්, (2) වන උපවගන්තියට අනුකූලව කරන ලද ඒ ගෙවීමට අදාළ ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ ප්‍රකාශයෙහි දක්වා ඇති බදු මුදල ඔහු විසින් ගෙවිය යුතු වන ආදායම් බද්දෙන් අඩු කර ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය;

(ආ) ඒ තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් නොවන්නේ නම්, (2) වන උපවගන්තියට අනුකූලව කරන ලද ඒ ගෙවීමට අදාළ ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබූ විට සහ XXIII වන පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඒ ප්‍රකාශයෙහි දක්වා ඇති බදු මුදල ආපසු ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියට අනුකූලව ආදායම් බදු අඩු කර ගැනීමට ඒ උපවගන්තියෙන් නියමිත යම් තැනැත්තකු විසින් කරන ලද යම් ගෙවීමකින් ඒ බද්ද අඩු කර ගැනීම පැහැර හරින අවස්ථාවක, එවිට—

(අ) ඒ තැනැත්තා පුද්ගලයකු නම්, ඒ පුද්ගල

සහ ද;

(ආ) ඒ තැනැත්තා, සංස්ථාගත කරනු ලැබූ නැතහොත් සංස්ථාගත කරනු නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වන්නේ නම්, ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්වරයා, කළමනාකරු හෝ වෙනත් ප්‍රධාන නිලධරයා

ඒ උපවගන්තිය යටතේ ඔහු විසින් අඩු කර ගැනීමට නියමිත බද්ද ගෙවීමට පෞද්ගලිකව යටත් විය යුතු ය. තවද, මේ පනතේ විධිවිධාන සලස්වන ලද සියලු ක්‍රමවලින්, අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයාගෙන්, ලේකම්වරයාගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් ඒ බද්ද අය කරගනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියෙහි "විනෝදාස්වාදය සපයන්නෙකුගේ හෝ ශිල්පියකුගේ වෘත්තිය හෝ රක්ෂාව" යන යෙදුමෙහි නළුවකුගේ, සංගීතඥයකුගේ, මල්ල ක්‍රීඩකයකුගේ හෝ පිනුම්කරුවකුගේ වෘත්තිය හෝ රක්ෂාව ඇතුළත් වන්නේ ය.'.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තියේ "5. නිර්වාසික තැනැත්තෙක් ශ්‍රී ලංකාවෙහි සිටින එම තැනැත්තාගේ අනුයෝජිතයා හෝ ඇටෝර්නි බලකරු" යන වචනවල සිට "යම් මණ්ඩලයක් හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක්"; තෙක් වූ වචන වෙනුවට "5. නිර්වාසික තැනැත්තෙක් ශ්‍රී ලංකාවෙහි සිටින එම තැනැත්තාගේ අනුයෝජිතයා හෝ ඇටෝර්නි බලකරු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මණ්ඩලයේ සාමාජිකයන් අවුරුදු තුනක කාලයකට ධුර දැරිය යුතු අතර ඔවුන් නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු විය යුතුය" යන වචන වෙනුවට "එසේ පත් කරන ලද මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ ඡේදයේ (i) අනුඡේදයේ "නොගෙවා පැහැර හරින බද්ද පියවීම සඳහා ඒ මුදල් ගෙවිය යුතු ය." යන වචන වෙනුවට "තහනමට ගැනීමේ වියදම් සහ ගාස්තු ගෙවීමෙහි ලා ඒ මුදල් පළමුවෙන් අදාළ කළ යුතු අතර, යම් ශේෂයක් වෙතොත් පැහැර හැරිය බද්ද පියවීම සඳහා එය අදාළ කළ යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ; තවද

(ආ) ඒ ඡේදයේ (ii) අනුඡේදයේ "එයින් ලැබෙන මුදල් නොගෙවා පැහැර හරින බද්ද පියවීම සඳහා යෙදිය යුතු ය;" යන වචන වෙනුවට "එයින් ලැබෙන මුදල් තහනමට ගැනීමේ වියදම් සහ ගාස්තු ගෙවීමෙහි ලා අදාළ කළ යුතු අතර, යම් ශේෂයක් වේනොත් පැහැර හැරිය බද්ද පියවීම සඳහා එය අදාළ කළ යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"දෙවන උපලේඛනය

(33 වන වගන්තිය)

අදායම් බද්දෙහි අනුප්‍රමාණ—සමාගම්

I වන කොටස

II වන කොටස සිට VI වන කොටස දක්වා වූ කොටස්වල සඳහන් සමාගමක් නොවන ශ්‍රී ලංකාවේ වාසික සමාගමක්

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම ආදායම් බදු අනුප්‍රමාණ

සමාගමේ බදු අයකළ හැකි ආදායම් මත ... ... සියයට 50 ය

II වන කොටස

රු. 2,50,000 ක් නොඉක්මවන බදු අය කළ හැකි ආදායමක් ඇති කුඩා සමාගමක්

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ

සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන රු. 50,000 ... සියයට 20 යි

සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 100,000 මත ... සියයට 30 යි

සමාගමේ බදු අයකළ හැකි ආදායමෙහි ඉතිරි කොටස මත ... සියයට 40 යි

III වන කොටස

රු. 2,50,000 ක බදු අය කළ හැකි ආදායම ඉක්මවන්නා වූ නිල ලැයිස්තු ගත පොදු සමාගමක් වන්නා වූ ද කුඩා සමාගමක්

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම ආදායම් බදු අනුප්‍රමාණ II වන කොටසෙහි සඳහන් අනුප්‍රමාණ විය යුතු ය.

IV වන කොටස

බදු අය කළ හැකි ආදායම රු. 2,50,000 ඉක්මවන්නා වූ නිල ලැයිස්තු ගත පොදු සමාගමක් නොවන්නා වූ ද කුඩා සමාගමක්

(අ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන්නා වූ එහෙත් 1982 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන්නා වූ සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම ආදායම් බදු අනුප්‍රමාණ II වන කොටසෙහි සඳහන් අනුප්‍රමාණ විය යුතු ය.

(ආ) 1982 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම ආදායම් බදු අනුප්‍රමාණ

සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන
රු. 50,000 මත ... ... ... සියයට 20 යි

සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ
රු. 1,00,000 මත ... ... ... සියයට 30 යි

සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ
රු. 1,00,000 මත ... ... ... සියයට 40 යි

සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස
මත ... ... ... සියයට 50 යි

## V වන කොටස

නිල ලැයිස්තුගත පොදු සමාගමක්.

1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අනුප්‍රමාණය

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ... ... සියයට 50 යි

1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම ආදායම් බදු අනුප්‍රමාණය

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ... ... සියයට 40 යි

## VI වන කොටස

ජනතා සමාගම්

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම ආදායම් බදු අනුප්‍රමාණය.

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ... ... සියයට 40 යි

## VII වන කොටස

(34 වන වගන්තිය)

ශ්‍රී ලංකාවෙහි නිර්වාසික සමාගමක්

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම ආදායම් බදු අනුප්‍රමාණය

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ... ... සියයට 50 යි ”

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.